# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1958/8 - 2016 මාර්තු මස 16 වැනි බදාදා - 2016.03.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**(404 වන අධිකාරිය වූ) දේශීය ණය සහ සංවර්ධන ආඥාපනත**

(404 වන අධිකාරිය වූ) දේශීය ණය සහ සංවර්ධන ආඥාපනතේ 11 වන වගන්තිය යටතේ දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස්වරයන් විසින් සාදනු ලැබ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද නියෝග.

දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස්වරයෝ.

2016 මාර්තු මස 16 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

2012 අගෝස්තු මස 16 වැනි දින අංක 1771/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝගය මගින් අවසන් වරට සංශෝධිත 1996 ජනවාරි මස 10 වැනි දින අංක 905/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1995 අංක 1 දරන දේශීය ණය සහ සංවර්ධන (විවිධ) නියෝග, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි එකොළොස්වන නියෝගයේ (2) වැනි ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

''(2) කොමසාරිස්වරයන් විසින්, 10 වැනි නියෝගයේ (2) වැනි ඡේදයේ සඳහන් ඕනෑම ව්‍යාපෘතියක ඇස්තමේන්තු ගත වටිනාකමින් සියයට අසූවක (80%) උපරිමය දක්වා ණය මුදල් ලබාදිය හැකි ය.

එසේ වුවද,

(අ) රුපියල් මිලියන දෙකක් නොඉක්මවන එවැනි යම් ණය මුදලක්, සභාපතිවරයාගේ නිර්දේශය මත කොමසාරිස්වරයන් විසින් ද ;

(ආ) රුපියල් මිලියන දෙක ඉක්මවන නමුත් රුපියල් මිලියන දහයක් නොඉක්මවන එවැනි යම් ණය මුදලක්, කොමසාරිස්වරයන් විසින් ද ;

(ඇ) රුපියල් මිලියන දහයක් ඉක්මවන එවැනි යම් ණය මුදලක්, කොමසාරිස්වරයන්ගේ නිර්දේශය මත, දේශීය ණය සහ සංවර්ධන අරමුදල යන විෂයය පවරා දී ඇති අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව, ප්‍රදානය කරනු ලැබිය හැකි ය.''

(2) එහි 12 වැනි නියෝගයේ ''කොමසාරිස්වරයන්'' යන වචනය සඳහා වූ අර්ථ නිරූපනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපනය ඇතුළත් කිරීමෙන් සහ ඒ සඳහා වූ අර්ථ නිරූපනය ඉවත් කිරීමෙන් :-

''සභාපතිවරයා'' යන්නෙන් ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ පත්කළ කොමසාරිස්වරයන්ගේ මණ්ඩලයේ සභාපතිවරයා අදහස් වේ.

04 - 166

1A - G 2884 — 11 (2016/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*